මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022 – 09 - 27

**ප්‍රවෘත්ති නිවේදනය**

**ආර්ථික අභියෝග ජය ගැනීමට සියලු දෙනා එක්ව කටයුතු කිරීමේ වැදගත්කම**
**වැඩබලන මුදල් අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතා**
**රාජ්‍ය බැංකු ප්‍රධානීන් හමුවේ අවධාරණය කරයි.**

වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ, ඊට මුහුණ දිය යුත්තේ කෙසේද යන්න හා රාජ්‍ය බැංකු කෙසේ ක්‍රියා කරන්නේද යන්න පිළිබඳව සාකච්ඡාවක් වැඩ බලන මුදල් අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.09.26 දින මුදල් අමාත්‍යාංශයේදී පැවැත්විය.

මේ වන විට මහජනතාව පත්ව ඇති පීඩාකාරී ආර්ථික තත්ත්වය හමුවේ ණය ගෙවීම් ඇතුළු බැංකු කටයුතුවලදී රජය සහ රාජ්‍ය බැංකු එක්ව සහනදායී සහ සමූහික පිළිවෙතක් අනුගමනය කිරීම සුදුසු බව අමාත්‍යවරයා රාජ්‍ය හා බැංකු නිළධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වමින් සේමසිංහ මහතා කියා සිටියේ, රටේ වත්මන් තත්ත්වයට මුහුණ දීමට හැකි ආකාරයෙන්, කෙටි කාලීන හා දීර්ඝ කාලීන ලිහිල් පිළිවෙත් අනුගමනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලෙසයි.

ආර්ථික වශයෙන් රට අභියෝගයකට මුහුණ දී ඇති මේ යුගයේ දී එය ජය ගැනීම සඳහා සියලු දෙනා එක්ව කටයුතු කිරීමේ වැදගත්කම මෙහි දී අවධාරණය කෙරිණි. එමෙන් ම රටේ ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා රජය සියලු පියවරන් අනුගමනය කරමින් සිටින බව ද අමාත්‍යවරයා මෙහි දී අවධාරණය කළේ ය.

මෙම සාකච්ඡාව සඳහා නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්, මුදල් අමාත්‍යාංශ අතිරේක ලේකම්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු මුදල් අමාත්‍යාංශ නිලධාරීහු සහ රාජ්‍ය බැංකු ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීහු ද මේ අවස්ථාවට සහභාගී වූහ.

මාධ්‍ය ඒකකය